ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2213/9 - 2021 පෙබරවාරි මස 02 වැනි අඟහරුවාදා - 2021.02.02

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78 (xvi)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වන වගන්තිය සමඟ කියවිය යුතු, එහි 97 වෙනි වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදන ලද නියමාවලිය.

ලේකම්,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

2020 දෙසැම්බර් මස 15 වැනි දින,
කොළඹ දී ය.

නියමාවලිය

1. මේ නියමාවලිය 2020 අංක 04 දරන "විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල් නියමාවලිය" යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය *ගැසට් පත්‍රයේ* පළකිරීමෙන් අනතුරුව බලාත්මක වන්නේ ය.

2. නියමාවලියේ විධිවිධාන, පනතේ 97 වන වගන්තිය යටතේ පිහිටුවන ලද (මෙහි මින්මතු "විශ්‍රාම වැටුප් අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල නියාමනය කිරීම, පරිපාලනය කිරීම සහ කළමනාකරණය සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

**විශ්‍රාම වැටුප් අරමුදලේ සාමාජිකත්වය**

3. (1) කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක ස්ථිර තනතුරක් දරන සහ 1999 සැප්තැම්බර් මස 1 වන දිනයේදී සේවයේ නිරත කාර්ය මණ්ඩලයේ සේවකයකු හට තමා විශ්‍රාම වැටුප් අරමුදලට දායක වී එහි සාමාජිකත්වය ලබා ගන්නේ ද යන්න

1A - PG 5294 — 175(2021/02)

මෙම *ගැසට් පත්‍රය www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

තීරණය කළ හැකි අතර, 1999 සැප්තැම්බර් මස 1 වන දිනට පසු ස්ථිර තනතුරකට පත් කරනු ලබන කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක කාර්ය මණ්ඩලය සඳහා එහි සාමාජිකත්වය අනිවාර්ය විය යුතු ය:

එසේ වුව ද, ස්ථිර තනතුරක් දරන්නකු එම ස්ථිර තනතුරට පත් කරන ලද දිනයේ සිට ඉදිරියට විශ්‍රාම යන වයස දක්වා අවම වශයෙන් අවුරුදු විස්සක සේවා කාලයක් නොමැති නම් ඔහුට විශ්‍රාම වැටුප් අරමුදලේ සාමාජිකත්වය දැරීමට හිමිකම නොතිබිය යුතු ය.

(2) 1999 සැප්තැම්බර් මස 1 වන දිනට සේවයේ නිරතව සිටි සහ විශ්‍රාම වැටුප් අරමුදලේ සාමාජිකයෙකු ලෙස පත්වීමට තීරණය කළ සේවා නියුක්තිකයකු පසු දිනයක දී ඔහුගේ තීරණය වෙනස් කිරීමට සහ විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදලේ පමණක් සාමාජිකත්වය ඉල්ලීමට අවසර නොලබන්නේ ය.

(3) කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි වන මාසික දායක මුදලක් සෑම සාමාජිකයකුගේම වැටුපෙන් විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

*විශ්‍රාම වැටුප් අරමුදල පරිපාලනය කිරීම*

4. (1) (මෙහි මින්මතු "ලේකම්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) කොමිෂන් සභාවේ ලේකම්වරයා විශ්‍රාම වැටුප් අරමුදල නියාමනය කිරීම, පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම සම්බන්ධව වගකිව යුතු ය.

(2) ලේකම්වරයා විසින් කොමිෂන් සභාවේ අනුමතය සහිතව මේ නියමාවලිය යටතේ ලේකම්වරයා සතු යම් බලතල, කාර්ය හෝ කර්තව්‍යය ක්‍රියාත්මක කිරීමට, කිරීමට සහ ඉටු කිරීමට කොමිෂන් සභාවේ ඕනෑම නිලධරයකුට පොදුවේ හෝ විශේෂයෙන් බලය පැවරිය හැකිවන අතර, ලේකම්වරයාගේ මගපෙන්වීම සහ පාලනය යටතේ එවැනි නිලධරයකු එවැනි යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සිදු කළ යුතු ය.

(3) ලේකම්වරයා විසින් විශ්‍රාම වැටුප් අරමුදල සඳහා පොදු ගිණුමක් ද, විශ්‍රාම වැටුප් අරමුදලේ සෑම සාමාජිකයකුටම අදාළව වෙනම ගිණුමක් ද විවෘත කොට තබාගත යුතු ය. එම සාමාජිකයාට අදාළව විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවනු ලබන සියලුම දායක මුදල්, විශ්‍රාම වැටුප් අරමුදලේ එම සාමාජිකයාගේ වෙනම ගිණුමට බැර කළ යුතු ය. විශ්‍රාම වැටුප් අරමුදලේ මුදල්, ලේකම්වරයාගේ භාරයේ තැබිය යුතු ය.

(4) විශ්‍රාම වැටුප් අරමුදලේ කටයුතු කලින් කල සමාලෝචනය කිරීම සහ ප්‍රතිපත්තිමය කාරණා සම්බන්ධයෙන් විශ්‍රාම වැටුප් අරමුදලට උපදෙස් දීම සඳහා 2015.03.17 වන දින අංක 1906/8 දරන රජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රය* මගින් පිහිටුවන ලද 2015 අංක 1 දරන අර්ථසාධක අරමුදල් නියමාවලිය යටතේ ක්‍රියාත්මක වන අධීක්ෂණ මණ්ඩලය වගකිව යුතු ය.

(5) (1) විශ්‍රාම වැටුප් අරමුදලට ආයෝජන කමිටු දෙකක් තිබිය යුතු ය. එනම් -

(අ) ප්‍රධාන ආයෝජන ලෙස කොමිෂන් සභාව විසින් තීරණය කරන ලද ආයෝජන සම්බන්ධයෙන් කටයුතු කිරීමට ප්‍රධාන ආයෝජන කමිටුව;

(ආ) සුළු ආයෝජන ලෙස කොමිෂන් සභාව විසින් තීරණය කරන ලද ආයෝජන සම්බන්ධයෙන් කටයුතු කිරීමට සුළු ආයෝජන කමිටුව.

(2) ප්‍රධාන ආයෝජන කමිටුව පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත විය යුතු ය:-

(අ) කොමිෂන් සභාවේ සභාපතිවරයා;

(ආ) ලේකම්වරයා;

(ඇ) කොමිෂන් සභාවේ මූල්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා;

(ඈ) කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් පත් කරන ලද ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කමිටුවේ නියෝජිතයකු.

(3) සුළු ආයෝජන කමිටුව පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත විය යුතු ය:-

(අ) කොමිෂන් සභාවේ උප සභාපතිවරයා;

(ආ) ලේකම්වරයා;

(ඇ) කොමිෂන් සභාවේ මූල්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා.

(4) මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද අදාළ රීති, නියෝග සහ චක්‍රලේඛවලට යටත්ව විධිමත්ව සකස් කරන ලද විශ්‍රාම වැටුප් අරමුදලේ ආයෝජන ප්‍රතිපත්ති මත පදනම්ව ප්‍රධාන ආයෝජන හා සුළු ආයෝජනවල මූල්‍ය සීමා, කොමිෂන් සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන්නේ ය.

(5) ආයෝජන කමිටුවල යම් රැස්වීමකට සහභාගී වීම සඳහා එකී ආයෝජන කමිටුවල සාමාජිකයන්ට කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි, දීමනා ගෙවිය යුතු ය. දීමනා වශයෙන් ගෙවන ලද මුදල් ප්‍රමාණය සහ ආයෝජන කමිටුවල අනෙකුත් වියදම්, විශ්‍රාම වැටුප් අරමුදලේ මුදලින් ගෙවනු ලැබිය යුතු ය.

(6) විශ්‍රාම වැටුප් අරමුදලේ ආයෝජන යෝජනා තක්සේරු කිරීමට සහ ආයෝජන ප්‍රතිපත්තිවලට අනුකූලව සුදුසු ආයෝජන තීරණ ගැනීමට හෝ සුදුසු ආයෝජන කිරීමට, ආයෝජන කමිටුව විධිමත්ව රැස්විය යුතු ය.

(7) ප්‍රධාන ආයෝජන කමිටුව විසින් ගන්නා ලද තීරණ සෑම මාස හයකට වරක්ම අධීක්ෂණ මණ්ඩලය වෙත වාර්තා කරනු ලැබිය යුතු ය.

*විශ්‍රාම වැටුප් අරමුදලේ වරප්‍රසාද*

6\. (1) (අ) අවුරුදු විස්සක් හෝ ඊට වැඩි කාලයක් සේවය කර ඇති සහ විශ්‍රාම ගන්නා වයස දක්වා සේවයේ යෙදුණු සෑම සාමාජිකයකු ම; හෝ

(ආ) අවුරුදු විස්සක් හෝ ඊට වැඩි කාලයක් සේවය කර ඇති සහ දුබල සෞඛ්‍ය තත්ත්වය නිසා විශ්‍රාම යන වයස සපුරාලීමට පෙර විශ්‍රාම යන සෑම සාමාජිකයකු ම,

උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති ප්‍රතිශතයක මාසික විශ්‍රාම වැටුපකට හිමිකම ලැබිය යුතු ය.

(2) (අ) වයස අවුරුදු පනස් පහ සම්පූර්ණ වන විට විශ්‍රාම යා හැකි එහෙත් අවුරුදු හැට දක්වා සේවය කිරීමට තීරණය කරන හෝ ඒ අතරතුර කාලයක දී විශ්‍රාම යන ආචාර්ය තනතුර හැර වෙනත් යම් තනතුරක් දරන්නෙකුට සමානුපාතික පදනමින් විශ්‍රාම වැටුපක් ගෙවිය යුතු ය.

(ආ) වැටුප් රහිත නිවාඩු හෝ වෙනත් යම් හේතුවක් නිසා යම් කාලවකවානුවක් සඳහා දායක මුදල් ලැබී නොමැති විටක දී, ගෙවිය යුතු විශ්‍රාම වැටුප ගණනය සඳහා සමස්ත සේවා කාලයෙන් එම කාලය අඩු කරනු ලැබිය යුතු ය.

(3) මරණය සිදුවන අවස්ථාවේ දී අවුරුදු විස්සක් හෝ ඊට වැඩි කාලයක් සේවය කළ සාමාජිකයකුගේ යැපෙන්නන්ට පහත දැක්වෙන අයුරින් විශ්‍රාම වැටුපක් ගෙවනු ලැබිය යුතු යඃ-

(අ) විශ්‍රාම වැටුපෙන් සියයට පනහක් (50%) වැන්දඹු කාන්තාවට හෝ වැන්දඹු පුරුෂයාට ගෙවිය යුතු ය;

(ආ) ඉතිරි සියයට පනහක (50%) මුදල සමාන කොටස්වලට බෙදා විශ්‍රාමිකයාගේ සුජාත දරුවන්ට වයස අවුරුදු 18 සම්පූර්ණ වන තෙක් ගෙවිය යුතු යඃ

එසේ වුව ද, ප්‍රතිලාභීන් සම්බන්ධව යම් ආරවුලක් ඇති වූ අවස්ථාවක දී, අධිකරණයේ තීරණයට අනුකූලව විශ්‍රාම වැටුප ගෙවිය යුතු ය.

(4) මේ නියමාවලිය යටතේ සාමාජිකයකුට හිමිවන සහ ගෙවනු ලබන විශ්‍රාම වැටුප ආරම්භ විය යුත්තේ එම සාමාජිකයා විශ්‍රාම ගැනීමේ දී හෝ එම සාමාජිකයාගේ මරණයෙන් පසු ඔහුගේ යැපෙන්නන්ට ද හිමි වන පරිදි ය. එය දිනපතා එකතුවන අතර මාසිකව ගෙවනු ලැබිය යුතු ය.

(5) අවස්ථාවෝචිත පරිදි, විශ්‍රාමිකයා හෝ යැපෙන්නා හෝ යැපෙන්නන් ජීවත්ව සිටින බව සහ එකී විශ්‍රාමිකයා හෝ යැපෙන්නන් හට තමන් විසින් අයිතිය කියා සිටින විශ්‍රාම වැටුපට හිමිකම් තිබෙන බව ලේකම්වරයා විසින් තහවුරු කරගත යුතු ය.

(6) මේ නියමාවලිය යටතේ බාල වයස්කරුවකුට ගෙවිය යුතු විශ්‍රාම වැටුප රජයේ අනුමත බැංකුවක ඇති බාලවයස්කරුගේ බැංකු ගිණුමකට බැර කරනු ලැබිය යුතු ය.

(7) අවුරුදු විස්සක සේවා කාලය සම්පූර්ණ වීමට පෙර විශ්‍රාම ගත්, ඉල්ලා අස් වූ හෝ සේවය අත්හිටුවන ලද යම් සාමාජිකයකුගේ ගිණුමෙහි බැරට ඇති දායක මුදල සහ පොළිය එම විශ්‍රාම ගැනීමේ දී, ඉල්ලා අස්වීමේ දී හෝ සේවය අත්හිටුවීමේ දී එම සේවකයාට ආපසු ගෙවනු ලැබිය යුතු ය.

(8) අවුරුදු විස්සක සේවා කාලය සම්පූර්ණ වීමට පෙර සාමාජිකයෙකු මරණයට පත්වන අවස්ථාවක දී හෝ අවිවාහක තැනැත්තෙකු හෝ තැනැත්තියක වන සාමාජිකයකුගේ මරණයක දී, ඒ සාමාජිකයාගේ ගිණුමෙහි බැරට ඇති දායක මුදල සහ පොළිය 7 වන නියමාවලියේ විධිවිධානවලට යටත්ව ගෙවනු ලැබිය යුතු ය.

## නම් කිරීම

7. (1) සාමාජිකයකු විසින්, ඔහුගේ මරණයෙන් පසු විශ්‍රාම වැටුප් අරමුදලේ එම සාමාජිකයාගේ ගිණුමට බැරව පවතින මුදල ගෙවනු ලැබීම සඳහා යම් තැනැත්තකුව නම් කළ හැකි ය. එසේ නමක් යෝජනා කිරීමට අපේක්ෂා කරන එම සාමාජිකයා -

(අ) විවාහක තැනැත්තකු නම්, ඔහුගේ කලත්‍රයා සහ දරුවන් එක්ව හෝ වෙන් වෙන් වශයෙන් නම් කළ යුතු ය;

(ආ) අවිවාහක නම්, ඔහුට ඕනෑම තැනැත්තකු නම් කළ හැකි ය.

(2) කිසිදු නම් කිරීමක් සිදු කිරීමට අපේක්ෂා නොකරන යම් සාමාජිකයකු, නම් කිරීමක් නොමැති බවට නම් කිරීමේ ලැයිස්තුවේ නිශ්චිතව සඳහන් කරමින් ස්වකීය අදහස ප්‍රකාශයට පත් කළ යුතු ය. එවැනි අවස්ථාවක දී රටේ අදාළ නීතිවලට අනුකූලව මුදල බෙදා දීම සිදු කරනු ලැබිය යුතු ය.

8. (1) සාමාජිකයා කොමිෂන් සභාවේ ප්‍රධානියා ඉදිරියේ හෝ එම සාමාජිකයා සේවයේ නියුතු උසස් අධ්‍යාපන ආයතනයේ ප්‍රධානියා ඉදිරියේ සහ එම සාමාජිකයාගේ අත්සනට සාක්ෂිකරුවකු වන වෙනත් සාමාජිකයකු ඉදිරියේ එම සාමාජිකයා විසින් නම් කිරීමේ පත්‍රය අත්සන් කර ඇත්නම් මිස, එවැනි නම් කිරීමක් වලංගු හෝ නීතියෙන් බලාත්මක නොවන්නේ ය.

(2) සාමාජිකයා විසින් එවැනි සෑම නම් කිරීමක් ම අවස්ථාවෝචිත පරිදි, කොමිෂන් සභාවට හෝ අදාළ උසස් අධ්‍යාපන ආයතනයට භාරදිය යුතු ය.

(3) යම් තැනැත්තකු හට අත්සන් කිරීමට නොහැකි වන අවස්ථාවක දී, ඔහු විසින් සිය අත්සන වෙනුවට ස්වකීය මහපට ඇඟිලි සලකුණ, කොමිෂන් සභාවේ ප්‍රධානියා හෝ ඔහු සේවයේ යෙදී සිටින උසස් අධ්‍යාපන ආයතනයේ ප්‍රධානියා ඉදිරිපිට දී තැබිය යුතු අතර,එම මහපට ඇඟිලි සලකුණ එම නම් කිරීම සිදු කරනු ලබන තැනැත්තාගේ මහපට ඇඟිලි සලකුණ බවට වෙනත් සාමාජිකයකු විසින් එම නම් කිරීමේ පත්‍රයේ සහතික කරනු ලැබිය යුතු ය.

(4) කිසිදු සාමාජිකයකුගේ නම් කළ තැනැත්තකු, සාමාජිකයාගේ අත්සන හෝ මහපට ඇඟිලි සලකුණ සඳහා සාක්ෂි දැරීම හෝ සහතික කිරීම සඳහා සුදුස්සකු නොවිය යුතු ය.

9. (1) එක් තැනැත්තකුට වඩා නම් කරනු ලැබ ඇති අවස්ථාවක,නම් කිරීම සිදුකරන සාමාජිකයා විසින් අදාළ නම් කරන ලද තැනැත්තන් වෙත ගෙවිය යුතු ප්‍රතිලාභ බෙදා දෙනු ලැබිය යුතු අනුපාතය නම් කිරීමේ පත්‍රයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි ය.

(2) එක් තැනැත්තකුට වඩා නම් කරනු ලැබ ඇති අවස්ථාවක සහ නම් කරන තැනැත්තන්ට ගෙවනු ලැබිය යුතු කොටස් සම්බන්ධයෙන් සාමාජිකයා විසින් කරන ලද කිසිදු නම් කිරීමක උපදෙස් දෙනු නොලැබූ අවස්ථාවක, ගෙවනු ලැබිය යුතු ප්‍රතිලාභ එසේ නම් කරන ලද තැනැත්තන්ට සමාන කොටස් වන පරිදි ගෙවනු ලැබිය යුතු ය.

10. (1) (අ) නම් කරන ලද තැනැත්තන් එක් අයකු පමණක් සිටින අවස්ථාවක එම තැනැත්තාගේ මරණයෙන් පසු;

(ආ) එක් අයකුට වඩා වැඩියෙන් නම් කරනු ලැබ ඇති අවස්ථාවක, එම නම් කිරීම කරන ලද සාමාජිකයාගේ ජීවිත කාලය තුළ දී එම නම් කරන ලද තැනැත්තන්ගෙන් එක් අයකුගේ මරණයෙන් පසු; හෝ

(ඇ) සාමාජිකයකු විසින් ඔහුගේ විවාහයට පෙර නම් කිරීමක් කර ඇති අවස්ථාවක, එම සාමාජිකයාගේ විවාහයෙන් පසු,

නම් කිරීමක් අවලංගු වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) සාමාජිකයකු විසින් සිදු කරන ලද යම් නම් කිරීමක් අවලංගු වූ ලෙස සලකනු ලබන අවස්ථාවක දී, නම් කිරීම සිදු කරන ලද සාමාජිකයා හට අලුත් නම් කිරීමක් සිදු කරනු ලැබිය හැකි ය.

11. (1) විශ්‍රාම වැටුප් අරමුදලේ සාමාජිකයකුගේ නම් කරන ලද තැනැත්තකුට විශ්‍රාම වැටුප් අරමුදලෙන් ගෙවීම් ලබා ගැනීමේ අයිතිය හිමි වනුයේ -

(අ) සාමාජිකයා විසින් විශ්‍රාම වැටුප් අරමුදලට දායකවන කාල වකවානුව අතරතුර දී ඔහු විසින් එම තැනැත්තාව නම් කර ඇත්නම්; සහ

(ආ) සාමාජිකයාගේ මරණයෙන් පසුව,

පමණක් ය.

(2) සාමාජිකයා මිය යන අවස්ථාවේ දී යම් නම් කළ තැනැත්තකු බාල වයස්කරුවකු වන විට එම නම් කළ තැනැත්තාට විශ්‍රාම වැටුප් අරමුදලෙන් ගෙවිය යුතු ගෙවීම;

(අ) එම මිය ගිය සාමාජිකයාගේ බූදලය සම්බන්ධයෙන් බූදල් නඩුවක් නොපවතී නම්, එම නම් කළ තැනැත්තාගේ නමට රජය අනුමත බැංකුවක, පනතේ විධිවිධානවලට යටත්ව එම මුදල් තැන්පත් කළ යුතු ය; හෝ

(ආ) මිය ගිය සාමාජිකයාගේ බූදලය සම්බන්ධයෙන් බූදල් නඩුවක් විභාග වෙමින් පවතින අවස්ථාවක දී, අධිකරණය විසින් ආඥා කරනු ලබන ආකාරයට එම මුදල් තැන්පත් කරනු ලැබිය යුතු ය.

(3) සාමාජිකයාගේ මරණය සිදුවන අවස්ථාවේ දී, වලංගු නම් කිරීමක් බලාත්මකව නොපවතී නම්, නැතහොත් අවස්ථාවෝචිත පරිදි නම් කළ තැනැත්තා හෝ නම් කළ තැනැත්තන් මිය ගොස් ඇත්නම්, අදාළ ගෙවීම් එම මිය ගිය සාමාජිකයාගේ නෛතික උරුමකරුවන් වෙත ගෙවනු ලැබිය යුතු ය.

12. විශ්‍රාම වැටුප් අරමුදල සඳහා වන නම් කිරීම අදාළ වන්නේ අවුරුදු විස්සක සේවා කාලය අවසන් කිරීමකින් තොරව සාමාජිකයා මිය යන අවස්ථාවේ දී විශ්‍රාම වැටුප් අරමුදලේ ශේෂය, ඔහුගේ නෛතික උරුමකරුවන් වෙත නිකුත් කරන විට පමණි.

**විගණනය සහ ගිණුම්**

13. (1) විශ්‍රාම වැටුප් අරමුදලේ මුදල් වර්ෂය, රජයේ මුදල් වර්ෂය ම වන්නේ ය.

(2) එක් එක් මුදල් වර්ෂය සම්බන්ධයෙන් වූ විශ්‍රාම වැටුප් අරමුදලේ ගිණුම්, විගණකාධිපතිවරයා විසින් විගණනය කරනු ලැබිය යුතු අතර, විගණනය සඳහා වූ පිරිවැය විශ්‍රාම වැටුප් අරමුදලින් ඔහු වෙත ගෙවනු ලැබිය යුතු ය.

(3) විගණකාධිපතිවරයා හෝ විශ්‍රාම වැටුප් අරමුදලේ ගිණුම් විගණනය කිරීම සඳහා ඔහු විසින් බලය පවරා ඇති ඔහුගේ දෙපාර්තමේන්තුවේ යම් නිලධරයෙකු හට, එම ගිණුම් විගණනය කිරීම සඳහා අවශ්‍ය බවට විගණකාධිපතිවරයා හෝ එම නිලධරයා විසින් සලකනු ලබන සියලු පොත් හා ලේඛන වෙත ප්‍රවේශ වීමට හැකි විය යුතු අතර, ඔවුන්ගේ දැනුමට අනුව එම කාර්ය සඳහා අවශ්‍ය විය හැකි වූ ද, ඔවුන් විසින් තහවුරු කරනු ලැබිය හැකි වූ ද තොරතුරු ද සමඟ ඒ පොත් හා ලේඛන, කොමිෂන් සභාව විසින් හෝ ලේකම්වරයා විසින් සපයා දිය යුතු ය.

(4) විගණකාධිපතිවරයා විසින් විශ්‍රාම වැටුප් අරමුදලේ ගිණුම් පරීක්ෂා කරනු ලැබිය යුතු අතර, -

(අ) තමාට අවශ්‍ය සියලු තොරතුරු තමා වෙත ලැබී ඇති බව හෝ ලැබී නොමැති බවට ප්‍රකාශ කරමින්;

(ආ) වාර්තාවේ සඳහන් ගිණුම් විශ්‍රාම වැටුප් අරමුදලේ කටයුතු සත්‍ය ලෙස හා සාධාරණ ලෙස එළි දැක්වෙන පරිදි නිවැරදිව සකස් කර ඇති බවට ප්‍රකාශ කරමින්; සහ

(ඇ) තමාගේ මතය අනුව එම ගිණුම්වල යම් පරීක්ෂා කිරීමක දී,එම ගිණුම්වල යම් අයිතමයක් පිළිබඳ අවධානය යොමු කිරීමට පාර්ලිමේන්තුව උනන්දු විය හැකි බවට අවධානය යොමු කරමින්,

වාර්ෂික වාර්තාවක් කොමිෂන් සභාවට භාර දිය යුතු ය.

(5) සෑම වර්ෂ තුනකට වරක්ම හෝ කොමිෂන් සභාව විසින් අනුමත කරන පරිදි, කොමිෂන් සභාව විසින් වෘත්තීමය ආයුගණක උපදේශකයකු පත්කරනු ලැබිය යුතු ය. විශ්‍රාම වැටුප් අරමුදලේ ජීව්‍යතාව සහතික කර ගැනීම සඳහා කොමිෂන් සභාව විසින්, ආයුගණක උපදේශකයා විසින් නිර්දේශ කරනු ලබන පරිදි, විශ්‍රාම වැටුප් අරමුදලේ නියම හා කොන්දේසි සංශෝධනය කිරීමේ අයිතිය තමා වෙත තබා ගත යුතු ය.

**සාමාජිකයන් විසින් කරනු ලබන ප්‍රකාශන සහ නිවේදන**

14. විශ්‍රාම වැටුප් අරමුදලට දායක වීමට වගකීමට බැඳුණු දින සිට මාස තුනක් ඇතුළත කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක සෑම සාමාජිකයකු විසින් ම, අවස්ථාවෝචිත පරිදි කොමිෂන් සභාවේ ප්‍රධානියා හෝ උසස් අධ්‍යාපන ආයතනයේ ප්‍රධානියා වෙත පහත දැක්වෙන තොරතුරු ඉදිරිපත් කළ යුතු යඃ-

(i) විශ්‍රාම වැටුප් අරමුදලේ සාමාජිකත්වය ලැබූ දිනයේ කළ ප්‍රකාශන;

(ii) සම්පූර්ණ නම සහ උපන් දිනය;

(iii) විවාහක නම් විවාහ වූ දිනය;

(iv) (අදාළ වන්නේ නම්)විවාහයට පෙර නම සමග කලත්‍රයාගේ සම්පූර්ණ නම;

(v) කලත්‍රයාගේ උපන් දිනය; සහ

(vi) සෑම දරුවකුගේම සම්පූර්ණ නම් සහ උපන් දින;

15. සෑම සාමාජිකයකු ම විවාහ වූ දිනයේ සිට මාස තුනක් ඇතුළත පහත දැක්වෙන තොරතුරු දක්වමින් ප්‍රකාශයක්, එම කාර්යය සඳහා සපයා ඇති ආකෘතියෙන් අවස්ථාවෝචිත පරිදි, කොමිෂන් සභාවේ ප්‍රධානියා හෝ උසස් අධ්‍යාපන ආයතනයේ ප්‍රධානියා වෙත ලබා දිය යුතු යඃ-

(i) එම විවාහයේ දිනය;

(ii) (අදාළ වන්නේ නම්) විවාහවීමට පෙර නම සමග කලත්‍රයාගේ සම්පූර්ණ නම;

(iii) කලත්‍රයාගේ උපන් දිනය;

(iv) විවාහයට පසු ඉපදුණු සෑම දරුවකුගේම උපන් දිනය;

(v) විවාහයට පෙර ඉපදුණු දරුවකුගේ හෝ දරුවන්ගේ නම් සහ උපන් දින.

16. සෑම සාමාජිකයකු ම පහත සඳහන් දෑ සිදුවීමෙන් මාස තුනක් ඇතුළත, අවස්ථාවෝචිත පරිදි කොමිෂන් සභාවේ ප්‍රධානියාට හෝ උසස් අධ්‍යාපන ආයතනයේ ප්‍රධානියාට ඒ පිළිබඳව දැනුම් දිය යුතු ය.

(i) කලත්‍රයාගේ මරණය හෝ වෙනත් යම් හේතුවක් නිසා විවාහක/ අවිවාහක තත්ත්වයේ වෙනස් වීමක්;

(ii) දරුවකුගේ උපතක් හෝ මරණයක්.

17. යම් ප්‍රකාශයක හෝ දැන්වීමක නිශ්චිතව සඳහන් තොරතුරක් වැරදි හෝ අසම්පූර්ණ බව කොමිෂන් සභාවේ ප්‍රධානියා හෝ උසස් අධ්‍යාපන ආයතනයක ප්‍රධානියා දැනුවත් වන අවස්ථාවක දී, අවස්ථාවෝචිත පරිදි, එම කොමිෂන් සභාවේ ප්‍රධානියා හෝ උසස් අධ්‍යාපන ආයතනයේ ප්‍රධානියා විසින් ලිඛිත දැන්වීමක් මගින් එම දැන්වීමෙහි නිශ්චිතව සඳහන් කාලසීමාව තුළ නිවැරදි හෝ සම්පූර්ණ තොරතුරු සපයමින් වැඩිදුර ප්‍රකාශයක්, එම ප්‍රකාශයේ හෝ නිවේදනයේ අඩංගු තොරතුරු පිළිබඳ ප්‍රමාණවත් සාක්ෂි සහිතව සිදු කරන ලෙස එම සාමාජිකයා වෙත නියම කරනු ලැබිය යුතු අතර, එවැනි සෑම දැන්වීමකම නියමයට අනුකූලව ක්‍රියා කිරීම එම සාමාජිකයාගේ කාර්යය විය යුත්තේ ය.

18. සෑම විශ්‍රාමිකයකු විසින් ම විශ්‍රාම වැටුප් අරමුදලෙන් මාසික විශ්‍රාම වැටුපක් ලබා ගැනීමට ඇති හිමිකම සඳහන් කරමින් ප්‍රකාශයක්, කොමිෂන් සභාව විසින් නියම කරනු ලැබිය හැකි ආකෘතියෙන් සෑම වර්ෂයකම ජනවාරි මස 31 වන දිනට පෙර කොමිෂන් සභාවේ ලේකම්වරයා වෙත භාරදිය යුතු ය. යම් විශ්‍රාමිකයකු නියමිත දිනට පෙර එම ප්‍රකාශය භාර දීමට අපොහොසත් වන්නේ නම්, එම ප්‍රකාශය භාර දෙන තෙක් මාසික විශ්‍රාම වැටුප අත්හිටුවනු ලැබිය යුතු ය.

**සාමාන්‍ය**

19. (1) නියමාවලිය හැර වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුව ද, එය නොතකා, විශ්‍රාම වැටුප් අරමුදලේ සාමාජිකයකු වෙත බැරට පවතින මුදල්, ගෙවිය යුතු වන යම් ණයකට, බැඳුම්කරයකට හෝ ගිවිසුමකට හෝ පහත සඳහන් අවස්ථා යටතේ යම් ඇදෑ තැබීමට, ඇපයක් ලෙස සිලවීවට අල්ලා ගැනීම නොකළ යුතු යඃ-

(අ) යම් සාමාජිකයකු කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක රැකියාව කරන කාලය අතරතුර ඕනෑම අවස්ථාවක දී, ඔහුගේ වංකභාවය හෝ නොසැලකිල්ල හේතුවෙන් එම කොමිෂන් සභාව හෝ උසස් අධ්‍යාපන ආයතනය විසින් දරන ලද යම් හානියක හෝ පාඩුවක ප්‍රමාණය;

(ආ) අවස්ථාවෝචිත පරිදි, කොමිෂන් සභාවෙන් හෝ උසස් අධ්‍යාපන ආයතනයකින් හෝ වෙනත් යම් ආයතනයකින් හෝ තැනැත්තකුගෙන් සාමාජිකයා විසින් ගන්නා ලද යම් ණයක් මත ගෙවිය යුතු ගෙවීම්;

(ඇ) සාමාජිකයා විසින් ලියා සහතික කරන ලද යම් බැඳීමක්, ගිවිසුමක් හෝ වෙනත් සාධන පත්‍රයක් යටතේ අයවිය යුතු මුදල්;

(ඈ) යම් අධිකරණයක ආඥාවක් හෝ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීම.

(2) (1) වන උපනියමාවලියේ විධිවිධාන, අවුරුදු විස්සක සේවා කාලයක් සම්පූර්ණ නොකරන හෝ විශ්‍රාම යන වයසට පෙර විශ්‍රාම ගත්, ඉල්ලා අස්වූ හෝ සේවය අවසන් කරන ලද යම් සාමාජිකයෙක් සඳහා අදාළ නොවිය යුතු යඃ

එසේ වුව ද, මෙම උපනියමාවලියේ නිශ්චිතව දක්වා ඇති සාමාජිකයකුගෙන් යම් මුදල් ප්‍රමාණයක් අඩු කිරීමේ දී, කොමිෂන් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන චක්‍රලේඛනවලට අනුව, විශ්‍රාම වැටුප් අරමුදලින් එසේ අඩු කිරීමට පෙර එම සාමාජිකයාගේ ලිඛිත අනුමතය ලබා ගත යුතු ය.

### ගැටුම් නිරාකරණය

20. (අ) නියමාවලියේ අර්ථානුකූලව යම් තැනැත්තකු සාමාජිකයකු වේ ද යන්න;

(ආ) සාමාජිකයකුගේ කලත්‍රයා හෝ දරුවකු ලෙස යම් තැනැත්තකු යම් විශ්‍රාම වැටුපකට හිමිකම ලබන්නේ ද යන්න;

(ඇ) සාමාජිකයකුගේ කලත්‍රයාට හෝ දරුවන්ට හිමිවිය යුතු විශ්‍රාම වැටුප් ප්‍රමාණය; හෝ

(ඈ) නියමාවලියේ යම් විධිවිධානයකට ආරෝපණය කළ යුතු අර්ථය හෝ අර්ථ දැක්වීම,

පිළිබඳ යම් ප්‍රශ්නයක් පැන නැගුණු විට දී, කොමිෂන් සභාවේ ප්‍රධානියා හෝ උසස් අධ්‍යාපන ආයතනයේ ප්‍රධානියා විසින් ඔවුන්ගේ මුල පිරීම මත හෝ එකී සාමාජිකයාගේ, කලත්‍රයාගේ හෝ දරුවන්ගේ ලිඛිත ඉල්ලීමක් මත තීරණයක් ගැනීම සඳහා කොමිෂන් සභාව වෙත එම ප්‍රශ්නය භාරදිය යුතු ය. ඒ පිළිබඳ කොමිෂන් සභාවේ තීරණය අවසන් තීරණය විය යුතු ය.

21. නියමාවලියේ කාර්ය සඳහා-

"පනත" යන්නෙන්, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත අදහස් වේ;

සාමාජිකයකුට අදාළව "විශ්‍රාම ගැනීමේ වයස" යන්නෙන්,පනතින් නිශ්චිතව දක්වා ඇති පරිදි, ආචාර්යවරයකු ද ඇතුළුව සේවකයකුගේ විශ්‍රාම ගැනීමේ වයස අදහස් වේ;

"කොමිෂන් සභාව" යන්නෙන් 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත මගින් පිහිටුවනු ලැබූ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අදහස් වේ;

"ප්‍රධානියා" යන්නෙන්-

(අ) කොමිෂන් සභාව සම්බන්ධයෙන් වන විට, කොමිෂන් සභාවේ සභාපතිවරයා ද;

(ආ) විශ්වවිද්‍යාලයක් හෝ විවෘත විශ්වවිද්‍යාලයක් සම්බන්ධයෙන් වන විට, එහි උපකුලපතිවරයා ද,

(ඇ) විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක්, උසස් අධ්‍යාපනය සඳහා වූ ආයතනයක් හෝ මධ්‍යස්ථානයක් සම්බන්ධයෙන් වන විට, එහි අධ්‍යක්ෂවරයා ද,

(ඈ) විශ්වවිද්‍යාලයක මණ්ඩපයක් සම්බන්ධයෙන් වන විට එහි මණ්ඩපාධිපතිවරයා ද,

අදහස් වේ;

"උසස් අධ්‍යාපන ආයතනය" යන්නෙන්, මේ පනත යටතේ පිහිටුවන ලද හෝ පිහිටුවනු ලැබ ඇතැයි සැලකෙන විශ්වවිද්‍යාලයක්, විවෘත විශ්වවිද්‍යාලයක්, විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක්, මණ්ඩපයක් අදහස් වන අතර එයට උසස් අධ්‍යාපනය සඳහා වූ ආයතනයක් හෝ මධ්‍යස්ථානයක් ද ඇතුළත් වේ;

"සාමාජිකයා" යන්නෙන් විශ්‍රාම වැටුප් අරමුදලෙහි දායකයකු වන, කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක ස්ථිර සේවකයෙකු අදහස් වේ;

"විශ්‍රාමිකයා" යන්නෙන්, මේ නියමාවලිය ප්‍රකාරව මාසික විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම ඇති සහ පහත සඳහන් අවශ්‍යතා සපුරාලන විශ්‍රාම වැටුප් අරමුදලේ සාමාජිකයකු අදහස් වේ:-

(i) විශ්‍රාම ගන්නා වයස වන තෙක් අවුරුදු විස්සක හෝ ඊට වඩා වැඩි කාලයක අඛණ්ඩ සහ ක්‍රියාකාරී සේවයක් සපයා ඇති සේවකයන්;

(ii) අවුරුදු විස්සක් හෝ ඊට වඩා වැඩි කාලයක් සේවය කර ඇති සහ විශ්‍රාම ගන්නා වයස එළඹීමට පෙර දුබල සෞඛ්‍ය තත්ත්වය හේතුවෙන් විශ්‍රාම යන සේවකයන්;

(iii) මිය යන විට අවුරුදු විස්සක් හෝ ඊට වඩා වැඩි කාලයක් සේවය කර ඇති සේවකයෙකුගේ යැපෙන්නන්;

"විශ්‍රාම වැටුප් අරමුදල" යන්නෙන්, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 97 වෙනි වගන්තිය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 1999 ජුනි 10 වන දින අංක 747 දරන චක්‍රලේඛය යටතේ පිහිටුවන ලද අර්ථ සාධක අරමුදලේ කොටසක් භාවිත කරමින් කොමිෂන් සභාව විසින් පිහිටුවන ලද අරමුදල අදහස් වේ;

"අර්ථ සාධක අරමුදල" යන්නෙන් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ XII වන කොටස යටතේ කොමිෂන් සභාව විසින් පිහිටුවන ලද අර්ථසාධක අරමුදල අදහස් වේ;

"වැටුප" යන්නෙන් යම් සාමාජිකයකු විසින් දරනු ලබන ස්ථිර තනතුරෙහි හෝ පත්වීමේ පඩිනඩි අදහස් වන අතර, කොමිෂන් සභා චක්‍රලේඛ මගින් ඔහුගේ වැටුපෙහි කොටසක් ලෙස ප්‍රකාශ කරනු ලැබිය හැකි යම් දීමනා ද එයට ඇතුළත් වේ;

"ලේකම්වරයා" යන්නෙන්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලේකම්වරයා අදහස් වේ;

"ආචාර්යවරයා" යන්නට, පනතේ ඒ සඳහා ඇති අර්ථයම ඇති අතර, එයට පුස්තකාලයාධිපති, නියෝජ්‍ය පුස්තකාලයාධිපති, ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති සහ සහකාර පුස්තකාලයාධිපති ඇතුළත් වේ.

**උපලේඛනය**

**{6 වන නියමාවලිය}**

| I වන තීරය | II වන තීරය |
|---|---|
| විශ්‍රාම ගැනීමේ වයස | සෑම සේවා වසරක් සඳහා ම රජය සහ කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරන ලද, අවසන් වරට ලබා ගන්නා මාසික වැටුපේ ප්‍රතිශතයක් ලෙස |
| 55 | 1.00% |
| 56 | 1.04% |
| 57 | 1.08% |
| 58 | 1.12% |
| 59 | 1.16% |
| 60 | 1.20% |
| 65 (ආචාර්යවරුන් පමණි.) | 1.40% |

01-93

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.